# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2344/40 - 2023 අගෝස්තු මස 11 වැනි සිකුරාදා - 2023.08.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1912 අංක 07 දරන ප්‍රසිද්ධ රැඟුම් පාලක පනත**

1969 අංක 11 දරන පනතින් සංශෝධනය වූ 1912 අංක 07 දරන රැඟුම් පාලක පනතේ 3 වැනි සහ 6(10) වැනි වගන්ති ප්‍රකාරව ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන නියෝග.

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
ජනමාධ්‍ය අමාත්‍ය.

2023 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ,
ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

නියෝග

01. මෙම නියෝග "රැඟුම් පාලක පනතේ බලපත්‍ර ගාස්තු අයකිරීමේ 2023 අංක 1 දරන නියෝග"යනුවෙන් හඳුන්වන අතර එය 2023 අගෝස්තු මස 15 වැනි දින සිට බලාත්මක වේ. 2015 ජූලි මස 10 වැනි දින අංක 1922/49 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2015 අංක 1 දරන නියෝග මෙයින් අවලංගු කෙරේ.

02. ශ්‍රී ලංකාව තුළ රැඟුම් පාලක පනත යටතේ මහජන ප්‍රදර්ශනයක් සඳහා නීත්‍යානුකූල බලපත්‍රය සඳහා අයදුම් කරන සෑම පුද්ගලයෙකුම/ආයතනයක්ම එකී අයදුම්පත්‍රය සමග පහත සඳහන් පරිදි බලපත්‍ර ගාස්තුවක් ගෙවිය යුතු ය :

(අ) චිත්‍රපට

| | | | |
|---|---|---|---|
| (i) | විදේශීය චිත්‍රපට සඳහා (පූර්ව ප්‍රචාරක පටය ද ඇතුළත්ව) | - රුපියල් | 40,000.00 |
| (ii) | දේශීය චිත්‍රපට සඳහා (පූර්ව ප්‍රචාරක පටය ද ඇතුළත්ව) | - රුපියල් | 15,000.00 |
| (iii) | පූර්ව ප්‍රචාරක පටය පමණක් ඉදිරිපත් කරන අවස්ථාවලදී | - රුපියල් | 1,500.00 |
| (iv) | සීමිත ප්‍රදර්ශනය සඳහා වන ඩීවීඩී/බ්ලූ රේ චිත්‍රපට සඳහා | - රුපියල් | 1,500.00 |
| (v) | ඉහත අංක (i),(ii),(iii) හා (iv) කාර්යයන් සඳහා හෝ සමීක්ෂණ කාර්යය සඳහා සිනමා ශාලා පහසුකම් සපයා ගැනීමේ ගාස්තුව | - රුපියල් | 37,500.00 |


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(අ. I) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත මණ්ඩලය වෙත බාර දීමෙන් අනතුරුව, වැඩ කරන දින 5ක් ඇතුළත බලපත්‍රය නිකුත් කරන අතර, හදිසි අවශ්‍යතා මත කෙටි කාලයක දී බලපත්‍රය අවශ්‍ය වේ නම්, පහත දැක්වෙන පරිදි අමතර ගාස්තුවක් ගෙවිය යුතු වේ.

(i) පැය 24 ක් ඇතුළත ලබා ගැනීම සඳහා නියමිත ගාස්තුවෙන් සියයට පනහක අමතර ගෙවීමක්.

(ii) එක් දින සේවයක් සඳහා නියමිත ගාස්තුවෙන් සියයට පනහක අමතර ගෙවීමක් (එක් දින සේවාව සඳහා වැඩ කරන දිනවල පෙරවරු 9.30ට කලින් අයදුම්පත් බාරදිය යුතු ය).

(iii) පාලක මණ්ඩලය ශාලාවේ තිරගත කිරීමේ පහසුකම් නොමැති අවස්ථාවල, අදාළ දිනයන්ට අනුගතවන සේ මණ්ඩලය වෙනුවෙන් තිරගත කිරීමේ වගකීම අයදුම්කරු විසින් දැරිය යුතු ය.

(iv) පැය 48කට පෙරාතුව මණ්ඩලය වෙත දැන්වීමෙන්, තිරගත කිරීම සඳහා නියම කරගත් දිනය වෙනස් කරලීමේ හැකියාව අයදුම්කරු සතු ය. එහෙත්, ඊට අඩු කාලයක දී හෝ මුල් වෙනස් කිරීමෙන් පසුව නැවත වෙනසක් සිදු කරන්නේ නම් හෝ එසේ වෙනස් කරන එක් එක් වාරයක් පාසා රුපියල් 5,000.00ක අමතර ගාස්තුවක් ගෙවිය යුතු ය.

**(ආ) වේදිකා නාට්‍ය**

| | | | |
|---|---|---|---|
| (i) | දීර්ඝ වේදිකා නාට්‍යක් සඳහා | - රුපියල් | 1,500.00 |
| (ii) | කෙටි වේදිකා නාට්‍යක් සඳහා | - රුපියල් | 750.00 |

(ආ. I) වේදිකා නාට්‍ය පිටපත් අනුමැතිය සඳහා අයදුම්පත් මහජන ප්‍රදර්ශනයට දින 21කට පෙරාතුව මණ්ඩලය වෙත බාරදිය යුතු ය. ඉන්පසු බාරදෙන නාට්‍ය පිටපත් සඳහා නියමිත ගාස්තුවෙන් සියයට සියයක අමතර ගාස්තුවක් අය කෙරේ.

**(ඇ) සංගීත හා ප්‍රාසාංගික සංදර්ශන**

| | | | |
|---|---|---|---|
| (i) | දේශීය කලාකරුවන් සහභාගී වන එළිමහන් සංදර්ශනයක් සඳහා | - රුපියල් | 3,750.00 |
| (ii) | දේශීය කලාකරුවන් සහභාගී වන ශාලාවක් තුළ සංදර්ශනයක් සඳහා | - රුපියල් | 3,000.00 |
| (iii) | විදේශීය කලාකරුවන් සහභාගී වන එළිමහන් සංදර්ශනයක් සඳහා | - රුපියල් | 37,500.00 |
| (iv) | විදේශීය කලාකරුවන් සහභාගී වන ශාලාවක් තුළ සංදර්ශනයක් සඳහා | - රුපියල් | 22,500.00 |
| (v) | රූපවාහිනී නාලිකා මගින් සෘජුව සංවිධානය කරන සංගීත හා ප්‍රාසාංගික සංදර්ශන සඳහා | - රුපියල් | 37,500.00 |
| (vi) | පෙර පාසල් සංදර්ශන | - රුපියල් | 2,000.00 |

(ඇ. I) සංගීත හා ප්‍රාසාංගික සංදර්ශන සඳහා අයදුම්පත් මහජන ප්‍රදර්ශනයට දින 10කට පෙරාතුව මණ්ඩලය වෙත බාරදිය යුතු ය. ඉන්පසු බාරදෙන අයදුම්පත් සඳහා නියමිත ගාස්තුවෙන් සියයට විසිපහක අමතර ගාස්තුවක් අය කෙරේ.

03. යම් සමාජයීය, අධ්‍යාපනික, සංස්කෘතික හා ආගමික වැදගත්කමකින් යුතු කුමන ආකාරයක හෝ සංදර්ශන සඳහා බලපත්‍ර, මණ්ඩලයේ අභිමතය පරිදි අදාළ ගාස්තුවෙන් නිදහස් කළ හැකි ය. ගාස්තුවෙන් නිදහස් කිරීම සඳහා කෙරෙන ඉල්ලීම් මහජන ප්‍රදර්ශනය පැවැත්වීමට දින 14කට පෙරාතුව මණ්ඩලය වෙත ලිඛිතව ඉල්ලුම් කළ යුතු ය.

04. අස්ථානගත වූ බලපත්‍රයක් වෙනුවෙන් යළි බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය වේ නම් ඒ සඳහා රුපියල් 1,500.00ක ගාස්තුවක් ගෙවිය යුතු වේ.

EOG 08-115

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.